# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 856 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 21/05/2024<br>පැය 1515 |

## මාධ්‍ය නිවේදනය

### සිදුකරන ලද යහපත් ක්‍රියාවක් වෙනුවෙන් පොලිස් නිලධාරීන් තිදෙනෙකුට ත්‍යාග පිරි නැමීම - පොලිස් මූලස්ථානය.

2024.05.19 වන දින අළුයම් කාලයේ නාල්ල පොලිස් වසමේ මාලදෙනිය ප්‍රදේශයේදී නාල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින්, රාත්‍රී රාජකාරි යෙදි සිටියදි සැකකටයුතු පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන සිදු කළ විමර්ශනයේදී එම සැකකාර පුද්ගලයා විසින් සිදු කල ත්‍රිත්ව මනුෂ්‍ය ඝාතනයක් සම්බන්ධයෙන් කරුණු අනාවරණය කරමින් එම අපරාධයේ සැකකරු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් වූ යහපත් ක්‍රියාව වෙනුවෙන් ඔවුන් අගයනු වස් පොලිස්පති ප්‍රසංශා හා පොලිස් ත්‍යාග අරමුදලෙන් මුදල් ත්‍යාග ලබා දීමේ වැඩසටහනක් **ගරු මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සහභාගිත්වයෙන්** 2024.05.21 වන අද දින උදෑසන බත්තරමුල්ල, සුහුරුපාය ගොඩනැගිල්ලේ 18 වන මහලේ මහජන ආරක්ෂක අමාත්‍යාංශයේදී පවත්වන ලදී.

මෙම යහපත් අත්අඩංගුවට ගැනීම් සිදු කළ නිලධාරීන් සඳහා ලක්ෂ 14 ක මුදලක් පොලිස් ත්‍යාග අරමුදලින් ලබාදීමට අනුමත කර ඇති අතර එහි පළමු අදියර වශයෙන් ලක්ෂ 07 ක මුදලක් පොලිස් සැරයන් 33008 එස්.පී.එස්.පතිරණ, පොලිස් සැරයන් 55461 එච්.පී.චන්ද්‍රසිරි සහ පොලිස් කොස්තාපල් 81112 කේ.එම්.එස්.යූ.කේ.සේනාධීර යන නිලධාරීන් තිදෙනාට මහජන ආරක්ෂක අමාත්‍යතුමා විසින් පිරිනැමීම සිදු කරන ලද අතර මෙම නිලධාරීන් මෙහෙයවමින් හා අධීක්ෂණ කටයුතු සිදු කළ නාල්ල පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක එච්.එම්.ඩී උපාලි හේරත් මහතාට පොලිස්පති ප්‍රශංසාවක් ලබාදී ඇත.

ඡායාරූප









මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.